කින්නියා ප්‍රාදේශීය සභාව
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
-----------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
------------------------------

2016 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 28 දින විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර පෙර වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 04 දින ඉදිරිපත් කර තිබුණි. 2016 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2017 අගෝස්තු 16 දින සභා ලේකම්වරයා වෙත යවා තිබුණි.

1.2 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දැක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට කින්නියා ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-------------------------------------

1.3.1 ගණකාධිකරණ ප්‍රතිපත්ති
----------------------------

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගත් ගණකාධිකරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කර නොතිබුණි.

1.3.2 ගණකාධිකරණ ඌනතා
------------------------

(අ) වාහන වටිනාකම රු.10,000 ක වටිනාකමින් වැඩියෙන් දැක්වීමට තුඩු දෙමින් රු. 2,940,000 ක් වටිනා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් සභාවට පරිත්‍යාග කරන ලද කැබ් රථයක වටිනාකම රු.2,950,000 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) රු. 43,916 ක් වූ සමාලෝචිත වර්ෂයේ ණය හිමියන් ජංගම බැරකම්වලට ඇතුළත් කර නොතිබුණි. ඒ හේතු කොට ගෙන ජංගම බැරකම් ඊට සමාන මුදලකින් අඩුවෙන් දැක්විණි.

(ඇ) මුදල් පොත අනුව 2016 දෙසැම්බර් 31 දිනට සභා බැංකු ගිණුමේ ශේෂය රු. 16,632 ක් විය. එනමුත් එදිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණු ශේෂය රු. 31,632 ක් වීම නිසා බැංකු ශේෂය රු. 15,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සභාව විසින් රු. 23,000 ක මිලට ගත් ප්ලාස්ටික් පුටු වියදම පුනරාවර්තන වියදම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) ගවමස් කඩ වලින් ලැබිය යුතු රු. 3,630,498 ක් වූ හිඟ බදු කුලී වසර 08 ක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම දක්වා තිබුණි.

(ආ) රු.2,100,175 ක් වූ විශ්‍රාම දායක මුදල් පියවීමකින් තොරව වසර 10 ක් තිස්සේ මූල්‍ය ප්‍රකාශනවල දිගින් දිගටම දක්වා තිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම.

එක් එක් ගිණුම් විෂය ඉදිරියෙන් දක්වා ඇති පහත සඳහන් සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් නොකෙරිණි.

| ගිණුම් විෂය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| | රු. | |
| යන්ත්‍රෝපකරණ | 910,925 | |
| ලී බඩු | 673,720 | ස්ථාවර වත්කම් ලේඛනය |
| මෝටර් වාහන | 3,029,710 | |
| ගෙවූ අත්තිකාරම් | 173,544 | කාල විශ්ලේෂණය |
| ගවමස් කඩ වලින් හිඟ මුදල් | 3,630,498 | ශේෂ තහවුරු ලිපි |

1.3.5 නීති,රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණන අවස්ථාවේදී නිරීක්ෂණය වූ අනුකල නොවූ අවස්ථා පහත දක්වා ඇත.

| නීති,රීති සහ රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය | වරිපනම් හා බදු අයකර ගැනීම සඳහා ඒවායේ වටිනාකම් තක්සේරු කිරීම පිණිස සභා බල ප්‍රදේශය තුළ පිහිටි නිශ්චල දේපළ හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) පළාත් මූල්‍ය රීති | |
| (i) රීති 187.2 | එකතුව රු. 2,106,258 ක් වූ ගෙවීම් වවුචර් 68 ක් 2013 වර්ෂයේදී අස්ථානගත කර තිබූ අතර, එකතුව රු.3,253,657 ක්වූ ගෙවීම් වවුචර් 44 ක් 2014 වර්ෂයේදී අස්ථානගත කර තිබුණි. එනමුත් අදාල රෙගුලාසි අනුව මේ සම්බන්ධයෙන් වහාම ගණන්දීමේ නිලධාරි විසින් විගණකාධිපතිට පිටපතක් සහිතව පළාත් භාණ්ඩාගාරය වෙත වාර්තාකර නොතිබුණි. |
| (ii) රීති 237 | රු.231,214 ක් වටිනා සභාව විසින් නිකුත් කරන ලද චෙක්පත් 32 ක් 2012 සහ 2014 වර්ෂවලදී ගෙවීම් සඳහා ඉදිරිපත් කර නොතිබුණි. එනමුත් ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) මෝටර් රථ ප්‍රවාහන පනතේ 203 වගන්තිය | වාහන සඳහා වාර්ෂිකව ආදායම් බලපත්‍ර ලබාගත යුතු වේ. එනමුත් 2015 සිට 2016 වර්ෂය තුළදී සභාව විසින් භාවිතා කළ වාහන 10 ක් සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සභාවේ පුනරාවර්තන වියදම් ඉක්මවූ රු. 1,015,331 ක් වූ අතිරික්තය ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ රු. 2,090,719 සමඟ සැසඳූ විට මූල්‍ය ප්රතිඵලයේ රු. 1,075,388 ක පිරිහීමක් පෙන්නුම් කෙරේ.

### 2.2 ආදායම් පරිපාලනය

---------------------

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-----------------------------------

සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව ඇස්තමේන්තු ගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම් පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත ආදායම | තත්‍ය ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ගෙවල් කුලී | 5,100 | 467 | 4,633 |
| වෙනත් ආදායම් | 28,140 | 23,892 | 4,248 |

#### 2.2.2 ගෙවල් කුලී ආදායම

---------------------

කච්චාකොඩ්ඩිතීවු පිහිටි පොදු වෙළඳපළ ගොඩනැගිල්ල බදුදීම.

------------------------------------------------------------------

පුරනැඟුම ව්‍යාපෘතිය යටතේ 2014 වර්ෂයේදී රු. 21,510,853 ක පිරිවැයකින් පොදු වෙළඳපළ සංකීර්ණය ඉදිකර තිබුණි. ගොඩනැගිලි සංකීර්ණයේ කඩ කාමර 32 හැරුණුවිට ගොඩනැගිලි සංකීර්ණයෙන් පිට කඩ කාමර 36 ක් තිබුණි. ගොඩනැගිල්ල තුළ වූ කඩ කාමර 32 සඳහා කඩ කාමරයකට රු. 30,000 බැගින් රු. 1,720,000 ක් වූ ආපසු ගෙවිය හැකි තැන්පතු මුදල් සහ සති අන්ත පොල පවත්වන ගොඩනැගිල්ලෙන් පිටත පිහිටි කඩ කාමරයක් සඳහා රු. 20,000 බැගින් ද කින්නියා ප්‍රාදේශීය සභාව විසින් ලබාගත යුතුව තිබුණි. ඒ නමුත් මේ දක්වා රු. 450,000 ක මුදලක් පමණක් ලබාගෙන තිබුණි.

2.3 විදුලි සන්දේශන කුළුණු සඳහා ගාස්තු

---

සභා බල ප්‍රදේශය තුළ බාහිර ආයතන විසින් ඉදිකර තිබූ විදුලි සන්දේශන කුළුණු 05 කින් ගාස්තු අයකර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

---

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) වසර 2008 සිට 2016 දක්වා කාලය තුළ වෙනත් අමාත්‍යාංශ සහ ආයතනවලින් පරිත්‍යාග වශයෙන් වාහන 05 ක් සභාවට ලැබී තිබුණි. එම වාහනවල අයිතිය ලබා ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) තොග ලේඛනය අනුව පරීක්ෂණ දින වූ 2017 ජූලි 06 දිනට කසළ බඳුන් 221 ක් ගබඩාවේ තිබිය යුතු විය. එනමුත්, එම කසල බඳුන් භෞතිකව නොපැවති අතර සභාව විසින් ඒ පිළිබඳ කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.4 වගන්තියට අනුව ණය බේරුම් කිරීමට ප්‍රථම නිලධාරියා මිය ගියගොත් ඔහුගේ උරුමක්කාරයන්ට ගෙවනු ලබන විශ්‍රාම වැටුපින් නිලධාරියාට දෙනු ලැබූ ණය ශේෂය අයකර ගත යුතු අතර, ඒ අනුව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂකට දැන්විය යුතුය. එනමුත් සභාව විසින් කටයුතු නොකිරීම නිසා සේවකයන් 06 දෙනෙකුගෙන් ලැබිය යුතු රු. 133,220 ක් සභාවට අයකර ගත නොහැකිවී තිබුණි.

(ඈ) වර්ෂ 2008 සිට 2013 දක්වා කාලය තුළ සේවක වැටුප්වලින් අයකරගත් රු. 548,525 ක්වූ විශ්‍රාම දායක මුදල් වැන්දඹු හා අනත්දරු අරමුදලට ප්‍රේෂණය කිරීමට සභාව විසින් මේ දක්වාම කටයුතු කර නොතිබුණි.

(ඉ) පළාත් මූල්‍ය රීති 163.3 නියම කර ඇති පරිදි දින 10 ක් තුළදී අත්තිකාරම් පියවිය යුතුය. එනමුත් වසර 07 ක කාල සීමාවක් ඉකුත්වී ඇති නමුත් රු.191,544 ක්වූ අත්තිකාරම් පියවී නොතිබුණි.

(ඊ) වසර 08 ක් ඉක්මවූ කාලයක් තුළදී රු. 5,428,716 ක්වූ ටෙන්ඩර් තැන්පතු, ආදායම් තැන්පතු, මිශ්‍ර තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 නියම කර ඇති පරිදි කටයුතු කර නොතිබුණි.

(උ) 2015 වර්ෂය තුළදී පැවැත්වූ සමීක්ෂණ මණ්ඩලය විසින් පෙන්වා දෙන ලද පහත සඳහන් ඌනතා සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි.

| විස්තරය | ප්‍රමාණය |
|---|---|
| පුටු | 98 |
| මේස | 11 |
| විදුලිපංකා | 03 |
| ප්‍රොජෙක්ටර් | 01 |
| කැමරා | 01 |
| GI බට | 15 |
| ජල ටැංකි | 02 |
| කුරුම්වන්කර්නි පුස්තකාලයේ පොත් | 992 |

3.2 අනාර්ථික ගනුදෙනු

---

රු.462,112 ක් වූ 2011 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදයට අදාළ සභාවේ සේවකයන් 13 දෙනෙකුගෙන් අයකරගත් සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් සහ රු.748,864 ක් වූ 2012 ජනවාරි සිට 2013 අගෝස්තු කාල පරිච්ඡේදයට අදාළ සේවකයන්

16දෙනෙකුගේ සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් නියමිත දිනවලදී ප්‍රේෂණය කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් රු. 540,770 ක මුදලක් අධිභාර වශයෙන් ගෙවා තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය
-------------------------

3.3.1 නාඩුතිව් වෙළඳපොල ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කිරීම
------------------------------------------------------------

නාඩුතිව් වෙළඳපොළ ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමේ කොන්ත්‍රාත්තුව රු. 3,000,000 ක පිරිවැයකට 2014 නොවැම්බර් 14 දින නාඩුතිව් ප්‍රජා මධ්‍යස්ථානයට පිරිනමා තිබුණි. ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ කරන ලද මෙම කර්මාන්තය පිළිබඳ පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ජල සම්පාදනයට අදාළ කටයුතු කොන්ත්‍රාත්කරු විසින් සිදුකර නොමැති වුවද, සතුටුදායකව සිදුකර ඇති බවට කාර්මික නිලධාරීන් විසින් සහතික කර රු. 24,122 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) 2015 නොවැම්බර් 20 දින කොන්ත්‍රාත්කරු විසින් ගොඩනැගිල්ල සභාවට භාරදී තිබුණි.එනමුත් එය ප්‍රයෝජනයට ගෙන නොතිබු බැවින් දරන ලද වියදම නිශ්ඵලව තිබුණි.

3.3.2 පොදු වැසිකිලිය සහ විවේක කාමරය ඉදිකිරීම
---------------------------------------------

පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ රු.1,000,000 ක පිරිවැයකින් මහජන වැසිකිලියක් සහ විවේක කාමරයක් ඉදිකිරීම සඳහා වු කොන්ත්‍රාතුව 2016 ජූනි 06 දින නොදුන්තීවු ප්‍රජා මධ්‍යස්ථානයට පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 සැප්තැම්බර් 06 දින නිම කළ යුතුව තිබු කර්මාන්තය මෙතෙක් නිමකර නොතිබුණි.

(ආ) වැඩ නිමකර නොතිබුණත් රු. 43,563 ක්වු පහත සඳහන් වැඩ සඳහා කාර්මික නිලධාරි විසින් ගෙවීම් නිර්දේශ කර තිබුණි.

| විස්තරය | ප්‍රමාණ පත්‍ර අංකය | මුදල |
|---|---|---|
| | | රු. |
| සේදීම් බේසම | 23 | 9,316 |
| නාම පුවරුව | 32 | 9,500 |
| තුවා රක්කය | 22 | 774 |
| ප්ලාස්ටික් පුටු | 33 | 11,373 |
| වො.25 විදුලි ඉතිරි කිරීම් ලාම්පු | 15 | 12,600 |
| | | 43,563 |

(ඇ) ගොඩනැගිල්ල ඉදිකර තිබු නමුත් ගොඩනැගිල්ලට විදුලිය හා ජල සම්බන්ධතා සපයා නොතිබු බැවින් එය ප්‍රයෝජනයට ගත නොහැකිව තිබුණි.

3.4 පාරිසරික ගැටළු
-----------------

1988 පනත් අංක 56 සහ 2006 අංක 53 පනත මඟින් සංශෝධිත 1980 අංක 47 මධ්‍යම පරිසර අධිකාරි පනත යටතේ, 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනය පරිදි මධ්‍යම පරිසර අධිකාරියෙන් බලපත්‍ර ලබාගැනීමෙන් තොරව සාථකාගාරය පවත්වාගෙන ගොස් තිබුණි. පරිසර දූෂණයට තුඩුදෙන පරිදි ඝාතනය කරන ලද සත්ව කොටස් අසල ගංගාවට වැටෙමින් පැවතුණි.

4. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පසුගිය වසර 09 පුරා පුරප්පාඩුව පවතින කළමනාකරණ සේවයේ විශේෂ ශ්‍රේණිය 1 තනතුර සහ පසුගිය වසර 4 පුරා පවතින සුළු සේවක පුරප්පාඩු 03 ක් පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි.

5. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

| | පද්ධති හා පාලන | අවධානය අවශ්‍ය කරුණු |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) ලෙජර් විධිමත්ව යාවත්කාලීනව පවත්වා ගෙන යාම.<br>(ii) වත්කම් වර්ගීකරණය |
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යාම. |
| (ඇ) | ආදායම් රැස්කිරීම | (i) ටෙන්ඩර් පිරිනැමීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලියක් අනුගමනය කිරීම.<br>(ii) මුදල් කොමිසම විසින් නිකුත් කළ චක්‍රලේඛවල උපදෙස් පිළිපැදීම. |